පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

ශ්‍රේණිය - 6

සතිය - 03

විෂය - චිත්‍ර

සැකසුම - උපුලී චතුරානි ධර්මසේන

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**<u>3.1.1 නිල් , කහ , රතු යොදමු. අලුත් රටා මවමු.</u>**

- වර්ණ හඳුනා ගනිමු.
  1. මූලික වර්ණ (නිල් , කහ , රතු)
  2. ද්විතීක වර්ණ (තැඹිලි (රඹ) , දම් , කොළ)
  3. තෘතීක වර්ණ (රඹදම් , රඹ කොළ)

  ලෙස වර්ණ කොටස් තුනකට බෙදයි.
- නිල් , කහ , රතු යනු මූලික වර්ණ වේ.

  එනම්, වෙනත් කිසිදු වර්ණයක් සමඟ මිශ්‍ර නොවී සෑදී ඇති වර්ණ වේ.



නිල් | කහ | රතු

**අභ්‍යාසය :- පහත පියවර අනුගමනය කරමින නිර්මාණයක් කරන්න.**

<u>අවශ්‍ය ද්‍රව්‍ය</u>

බ්‍රිසිල් බෝඩ්, සුදු කඩදාසි, රළු මතුපිටක් ඇති පෘෂ්ඨයක් (වැලි කඩදාසි, ගෝනි කැබැල්ලක්), වර්ණ (නිල්, කහ, රතු, කළු), ශාක පත්‍ර

**<u>නිර්මාණය කරන ආකාරය</u>**

- ශාක පත්‍රයක සරල හැඩයක් බ්‍රිසිල් බෝඩ් එකෙන් කපා ගන්න. (අච්චුවක්)



- සුදු කඩදාසි මත නිල්, කහ, රතු වර්ණ යොදා කපා ගත් අච්චුව තබා අවශ්‍ය තරම් පිටපත් කපා ගන්න.





- රළු මතුපිටක් ඇති පෘෂ්ඨයක් මත සුදු කඩදාසිය තබා කළු පැස්ටල් කූර පැත්ත හරවා වර්ණ කරගන්න.



- ඒ මත කපා ගත් හැඩ තල සමබර වන සේ විධිමත් රටාවකට අලවාගන්න.

